සෞඛ්‍යමත් භික්ෂු දිවියකට ඛුද්දකවත්ථුක්ඛන්ධකයේ උපයෝගීතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පරසන්ගස්වැව සුමනතිස්ස හිමි

ප්‍රවේශිකා

සමස්ථ බුද්ධ වචනය විවිධ අයුරින් විවිධ කාලවකවානු වලදී වෙන්කර බෙදා දැක්වූ බව ප්‍රකට කරුණකි. අටුවාචාරීන් විවිධ අයුරින් බුද්ධ වචනය වෙන් කර දැක්වුවද[1] ත්‍රිපිටක බෙදීම් ක්‍රමය ලොව පුරා ප්‍රචලිතව ඇත්තේ සමස්ථ බුද්ධ වචනයම එහි සංග්‍රහ වී ඇති නිසාවෙනි. සූත්‍ර පිටකය, විනය පිටකය, අභිධර්මය පිටකය යන ත්‍රිවිද පිටකය අතුරින් විනය පිටකය වනාහි භික්ෂු භික්ෂුණී උභය සංඝයා වෙත පනවන ලද විනය පැනවීම්හි එකතුවකි. පාරාජිකපාළි, පාචිත්තියපාළි, චුල්ලවග්ගපාළි, මහාවග්ගපාළි සහ පරිවාරපාළි යන කොටස් පහකින් යුක්ත වූ විනය පිටකය භික්ෂු ජීවිතයේ විශේෂ පැතිකඩක් හෙළිදරව් කරයි. චුල්ලවග්ගපාලිය වනාහි කම්මක්ඛන්ධකය, පාරිවාසික්ඛන්ධකය, සමුච්චයක්ඛන්ධකය, සමථක්ඛන්ධකය, ඛුද්දකවත්ථුක්ඛන්ධකය, සේනාසනක්ඛන්ධකය, සංඝභේදකක්ඛන්ධකය, වත්තක්ඛන්ධකය, පාතිමොක්ඛට්ඨපනක්ඛන්ධකය, භික්ඛුණීක්ඛන්ධකය, පංචසතික ඛන්ධකය සහ සත්තසතිකක්ඛන්ධකය යන ඛන්ධක දොළසකින් යුක්ත වූවකි. මේ අතරින් ඛුද්දකවත්ථුක්ඛන්ධකය වනාහි සමකාලීන භික්ෂූන්ගේ සහ සැදැහැවත් දායකයින්ගේ ක්‍රියාකාරකම් සංග්‍රහ වී ඇති ඓතිහාසිකමය වටිනාකමකින්ද යුත් මූලාශ්‍රයක් ලෙස සම්භාවනාවට පත්ව ඇති අතර සෞඛ්‍යමත් භික්ෂු දිවියක් ගතකිරීමට අවැසි උවදේසයන් රාශියකගේන් සමන්විත වූවක්ද වේ. බුදු සමය වනාහි සර්වසම්පූර්ණ සාර්ථක දිවියකට මග පෙන්වන ධර්මයකි. බුදු සමය හුදු ශාරීරික සෞඛ්‍ය (ආරෝග්‍යා පරමාලාභා) පමණක් අගය නොකරන අතර මානසික සෞඛ්‍ය (සන්තුට්ඨීපරමං ධනං), සාමාජීය සෞඛ්‍ය (විස්සාසපරමා ඤාතී) සහ ආධ්‍යාත්මික සෞඛ්‍ය (නිබ්බාණං පරමං සුඛං) යන සිව් වැදෑරුම් සෞඛ්‍යම අගයකරනු ලබයි.[2] භික්ෂු ජීවිතයේ විවිධ අංශයන් ආවරණය වන දේශනාවන් සහ පැනවීම්

බුද්දකවත්ථුක්ඛන්ධකයෙහි විද්‍යමාන වුවද මෙම ලිපිකරණයේ අභිප්‍රාය වනුයේ කායික වශයෙන් සෞඛ්‍යමත් භික්ෂු දිවියක් ගොඩනගාගැනීමට අවශ්‍ය ධර්ම කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමුකිරීමයි.

බුද්දකවත්ථුක්ඛන්ධකයේ අන්තර්ගතය

බුද්දකවත්ථුක්ඛන්ධකයෙහි හැඳීම්, පෙරවීම්, නෑම්, කෑම්, පීම් ආදියේදී භික්ෂුව පිළිපැදිය යුතු ආකාරයත් නොපිළිපැදියයුතු ආකාරයත් පිළිබඳව විශේෂයෙන්ම කරුණු සංගෘහිතව ඇති අතර මේ බොහෝ පැනවීම්හි මුල්වූවෝ සවැගි (ඡබ්බග්ගිය) භික්ෂූන් වීම විශේෂත්වයකි.[3] මෙත්තිය, භූම්මජක, අස්සජි, පුනබ්බසුක, පණ්ඩුක සහ ලෝහිතික යන සවැගි භික්ෂූන්ට ඔවුන් ලෙසම සිතන සහ ඔවුන් ලෙසම ක්‍රියාකරන ශිෂ්‍ය ප්‍රජාවක්ද වූ බව අටුවානයින් දැකගත හැකිය. මොවුන් නිරතුරුවම ශාසන විරෝධී ක්‍රියාවන් සිදුකරන අතර බුදුහු එකී චර්යාවන් බැහැර කරනුයේ විවිධ ශික්ෂාවන්ද පනවමිනි. එසේ වුවද ඔවුහු වෙනත් අයුරකින් එකී විරෝධී ක්‍රියාවන් සිදුකිරීමට යුහුසුළු වූහ. එසේ හෙයින් සවැගි භික්ෂූන් නිරතුරුවම ශාසනය තුළ ප්‍රසිද්ධියට පත්වූ බව නොරහසකි. තතු කෙසේ වෙතත් සවැගීන්ගේ ක්‍රියාවන් නිරතුරුවම ශාසනයේ යහ පැවැත්ම උදෙසාම යොමුකිරීමටම බුදුහු ක්‍රියා කළහ. එමගින් තවෙකෙකුට එකී ශාසන විරෝධී ක්‍රියාවන් නැවත නොකරන ලෙස බුදුපියාණන් වහන්සේ විසින් විනය ශික්ෂාවන්ද පැනවීමද ශාසන පාරිශුද්ධිය උදෙසාම හේතු විය.

සෞඛ්‍යමත් භික්ෂු දිවියකට බුද්දකවත්ථුක්ඛන්ධකයෙන් උවදෙස්

බුද්දකවත්ථුක්ඛන්ධකාරම්භයේදීම සංවාදයට බඳුන් වන්නේ ස්නානය සම්බන්ධ කරුණකි. බුදුපියාණන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩවාසය කරන කල්හි සවැගි භික්ෂූහූ ස්නානය කරනුයේ කලවාද අත්දඬුද ළයද පිටද ශරීරාවයවද රුකෙහි උලන්නෝය.[4] මේ පිළිබඳව මිනිසුන් විරෝධාකල්පයකින් යුක්ත වූ බවද එහිම දක්නට ලැබේ.[5] අනතුරුව බුදුරජාණන් වහන්සේ විසින් එකී ක්‍රියාව නොයෙක් අයුරින් ගර්හා කොට යමෙක් එසේ කරයිනම් දුකුළා ඇවතක් සිදුවන්නේ[6] යැයි වදාළේය.[7] තවද සවැගි මහනුන් විසින් නොයෙක් ආකාරායන් එකී ක්‍රියාවේම යෙදෙනුයේ වරෙක ටැඹකද වරෙක බිත්තියකද වරෙක ඔවුන් ඔවුන්ගේ ඇඟ එකට උලා

ගනිමින්ද නාහනුයේ බුදුහු නිරන්තරයෙන්ම ඔවුන්ගේ ක්‍රියාවන් ගර්හා එමගින් දුකුළා ඇවතක් සිදුවන බව වදාළහ.[8] මෙම පැනවීමට ප්‍රධාන හේතුව වශයෙන් චුල්ලවග්ගපාලායෙහි හමුවන කරුණ දෙස අවධානය යොමකිරීම වටී. ප්‍රධාන වශයෙන්ම දායක පක්ෂයේ විරෝධය සහ සමාජයෙන් නැගුණ ප්‍රතිරෝධයට ප්‍රතිචාර දක්වීම් වශයෙන් බුදුරජාණන් වහන්සේ මෙම පැනවීම සිදුකර ඇති බව පැහැදිලිය. නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසත් පැහැදුණවුන්ගේ පැහැදීම වඩා වර්ධනය වීම පිණිසත් මෙකී ඇවත පැනවූ බව තවදුරටත් චුල්ලවග්ගපාළිය පැහැදිලි කරයි. මෙකී පැනවීම හුදු සමාජප්‍රතිරෝධයේ ඵලයකැයි කීම තරමක් සාධාරණ වුවද මෙහි ගැබ්ව ඇති සෞඛ්‍යාත්මක සංසිද්ධීන් පිළිබඳව අවධානය යොමුකිරීම මෙහිලා උපයුක්තය. නූතන චර්මරෝග විශේෂඥයින් පෙන්වාදෙන අන්දමට සමේරෝග බෝවීම අයෙකුගෙන් තවෙකෙකුට සිදුවීමේ සම්භාවිතාවක් පවතියි. ඒ අනුව ස්නානය කිරීමේදී පොදුවේ ශරීරය ඉලීමේ සිථාන, ටැම්, බිත්ති, සහ එකිනෙකා ප්‍රතිවිරුද්ධව සිට පිටින් පිට තබා ඉලීම මගින්ද එලෙස චර්මරෝග අයෙකුගෙන් තවෙකෙකුට බෝවීම නැවැත්විය හැකිය. ඒ අනුව මෙකී පැනවීමේහි විද්‍යාත්මක උපයෝගීතාවක්ද ඇති බව සිතිය හැකිය. එසේම අපවිත්‍රවවූ ස්ථානයක තම ශරීරය ඇතිල්ලීමෙන් විෂබීජ ශරීරාගතවීමේ (germ infection) සම්භාවිතාවක්ද ඇතිබව සිතිය හැකිය. තවද අළුහන්, කුෂ්ට, දද වැනි බෝවන බෝවන සමේ රෝග බෝවීමේ අවධානමක් පැහැදිලිවම දකින්නට පුළුවන. එසේ හෙයින්ද මෙකී තහංචිය භික්ෂු ජීවිතයට ධනාත්මක තහංචියක් ලෙස අර්ථකථනය කිරීමේ හැකියාවක්දවේ. තවද අත්ල භාවිතයෙන් තම ශරීරය ඇතිල්ලීමට බුදුපියාණන් වහන්සේ භික්ෂුවට අවසරදී ඇති අතර පිරිසිදු රෙදිකඩකින් එසේ කිරීමේ වරදක් නොමැතිබවද තවදුරටත් ඛුද්දකවත්ථුක්ඛන්ධකයේ දක්නට ලැබේ.[9] විශේෂයෙන්ම ගිලන් භිෂූන්ට බුදුපියාණ් වහන්සේ මෙම අවසරය දී ඇති බව තවදුරටත් එහිම දක්වේ. ඛුද්දකවත්ථුක්ඛන්ධකාවසානයෙහි හමුවන උදානයෙහි මේ පිළිබඳ සංක්ෂිප්තයක් මෙලෙස දක්වේ.[10] රුකෙහි කය ඉලීම, ටැඹෙහි කය ඉලීම, බිත්තියෙහි කය ඉලීම, නොතන්හි නෑම, දවමුවා අතින් සිරුර ඉලීම, කිරිඳි හුයින් ඇඟ ඉලීම, උනුන් සිරුර ගටා පිරියම් කැරැවීම, මල්ලකයෙන් සිරුර ඉලීම, කැසීම් රෝගයට මල්ලකය අනුදැනීම, ජරායෙන් පෙළුණාහට උක්කාසිකාව අනුදැනීම,

පුථුපාණිකාව අනුදැනීම[11] පිළිබඳ විස්තරයක් පළමුව හමුවේ. නූතන වෛද්‍ය විද්‍යාවට අනුව සමට හානියක් නොකොට සෞඛ්‍යමත්ව සමෙහි මතුපිට ඇති කුණු දුහුවිලි ඉවත් කිරීමේ නිවැරදි ක්‍රමය ලෙස දක්වන්නේ අත්ල භාවිතයෙන් හෝ සිනිඳු රෙදිකඩක් භාවිත කරමින් සම පිරිසිදු කරගැනීමයි. මේ අනුව විද්‍යමාන වන්නේ බුදුපියාණන් වහන්සේ සමාජයට කන්දීමත් සමඟම සෞඛ්‍යමත්ව තම දිවිය ගත කිරීමට භික්ෂුවට උපදෙස් දී ඇති බවයි.

අනතුරුව හමුවන ප්‍රඥප්තීන් අතර හිසකේ කැපීමේ පිළිවෙළ හා ප්‍රමාණය පිළිබඳ දනවන පැනවීම සෞඛ්‍යවත් ජීවිතයක් ගතකිරීමට භික්ෂුවට මහෝපදේශකි. ඡබ්බග්ගිය භික්ෂූන් විසින් විවිධ ආභරණ පැළඳි කළ එකී ආභරණ දැරීම භික්ෂුවට අනුචිත බව දක්වමින් එසේ යම් භික්ෂු කෙනෙකු කරන්නේනම් ඔවුන් හට දුකුළා ඇවතක් සිදුවන බවද පැණවීය.[12] සවැගි භික්ෂූන්ගේ සිත විවිධාකාරයෙන් ලෞකික සිතිවිලි ආග්‍රාහණය කිරීමට උත්සහ දරණු පෙනේ. සවැගි මහණහු හිස මුඩුනොකරණුයේ දික් කෙහෙ දරත්. මෙපිළිබඳව පෙර පරිදිම මිනිසුන් ගර්හා කොට කථා කරති. නුගුණ කියත්. එසේ හෙයින් බුදුපියාණන් වහන්සේගේ පැණවීම වන්නේ යමෙක් එසේ දික් වූ කෙහේ දරත් නම් ඕ හට දුකුළා ඇවත් වන බවයි.[13] තවදුරටත් එකී බුද්ධප්‍රඥප්තිය හිසකෙහෙ වැවීමේ ප්‍රමාණය පිළිබඳවද දක්වා ඇත.[14] ඒ අනුව දෑඟුළක් තරම් වන තෙක් හෝ දෙමසකට වරක් හෝ හිසකෙහෙ බෑම සිදුකළ යුතු බව බුද්ධාඥාවයි.[15] සමන්තපාසාදිකානාම විනයට්ඨකථාව මෙකී පැනවීම පිළිබඳව විස්තාරිත විවරණයක් ඉදිරිපත් කරනු පෙනේ. "දුමාසිකං වා දුවඞ්ගුලං වා"[16] යන්න විස්තර කරන අටුවාව පවසන්නේ ඉඳින් කෙස් දෙමසක් තුළ දෙයඟුලක් වැඩී සිටියේද සිඳිය යුතුය. දෙයඟුල ඉක්මවවීම නොවටියි. ඉඳින් දිග් නොවුයේද දෙමසකට වඩා එක් දවසකුදු ඉක්මවීම නොලබාමය. මෙසේ දෙකින්ම පහලට පිරිසිඳීම වදාරණ ලද්දේය. ඉන් මෙපිට නොවටින බවෙක් නැත්තේය.[17] මේ අනුව පැහැදිලි වන්නේ භික්ෂුවක් අවම වශයෙන් හිසකෙහෙ දෑගුලක් වීමට පෙරාතුව හෝ දෙමසකට වරක් හෝ හිසකෙහේ පිරිසඳීම සිදුකළ යුතු බවයි. මෙහිද විද්‍යාත්මක පසුබිමක්ද තිබෙන බව පෙනේ. හිසකෙහෙ බෑම මගින් මිනිස් ශරීරයට සිදුවන වාසි පිළිබඳව බොහෝ වෛද්‍යවරුන්, පර්යේෂකයින් සාකච්ඡා කරනු පෙනේ. වර්තමානයෙහි කායවර්ධනය පිළිබඳ සාමාර්ථයින්ද

මේ පිළිබඳව නොයෙකුත් තන්හි සාකච්ඡාවට බඳුන්කර තිබේ.[18] මොවුහුගේ මතවාදයන් විවිධාර වුවද ඒවායින් බොහෝමයක් හිස මුඩු කිරීම ධනාත්මක[19] මෙන්ම සෞඛ්‍යය විද්‍යාත්මක වටිනාකමමින් හෙබි ක්‍රියාවකැයි[20] පැවසීමට පසුබට නොවෙති. හිස කෙහෙ කොටට කැපීම වනාහි හිසෙහි මතුපිටින් ඇතිවන විවිධ රෝගාබාධායන් වලක්වා ගත හැකි බවත් එය සෞඛ්‍යමත් දිවියකට ඍජුවම හේතුවන බවත් මෙහිලා පැවසිය යුතුය. විශේෂයෙන්ම හිස් කබල මතුපිටින් හටගන්නා විවිධ රෝගාබාධ වලවක්වාගැනීමට මෙන්ම අවම කරගැනීමට මෙකී මුඩුහිස හේතුවන බව සිතිය හැකිය. තවද හොරි, ඉස්හොරි, දද, කුෂ්ට වැනි හිංසාකාරී රෝගාබාධනට ගොදුරුවීමේ අවධානම අවම වී යන අතර කායිකව නිරෝගී වීමට එය උපකාර වන බවනම් අවිවාදිතය. එසේම විවිධ දිලීර හේතුවෙන් සිදුවන ආබාධ සේම උකුණන්, ලේඩින් වැනි කුඩා කෘමීන්ගෙන් සිදුවන හානියද එමගින් පැන නගින සෞඛ්‍යය ගැටලු ද විසඳා ගැනීමට මුඩුහිස උපකාරී වන බවනම් නොකිවමනාය. මෙසේ විවිධ මානයන්ගෙන් මෙකී ප්‍රස්තුතය පිළිබඳ විමසීමේ හැකියාවක් පවතී. ශාසනරතියෙහි ඇලුණු යෝගාවචරයාට දිගකෙස් නිරතුරුවම අනවශ්‍යය කරදරයකි. හිස පීරීම, විවිධ ආලේපන ගැල්වීම, කෙස් කලඹ පිරිසිදු කිරීම වැනි ක්‍රියාවන් අමතර වෙහෙසක් දරා සිදුකිරීම සිදුකළ යුතු අතර එවැනි ක්‍රියාවන්ද දුකුලා ඇවතක් වන බව ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහි[21] දක්වා තිබේ. නමුදු කිසියම් අක්ෂි රෝගයක් හෝ මුවෙහි යම් ආබාධයක් ඇතිවූ විට ඖෂධ ගැල්වීමේ අවසරයද භාග්‍යවතුන් වහන්සේ විසින් තම ශිෂ්‍යයිනට ලබාදී ඇත.[22] මෙහිදී පැහැදිලි වන්නේ බුදුපියාණන් වහන්සේ විනය ප්‍රඥප්තීන් පැනවීමේදී භික්ෂුවගේ කායික සක්‍යතාව පිළිබඳ වැඩි අවධානයක් යොමුකර ඇති බවයි.

මෛත්‍රියේ ආනුභාවයත් මෛත්‍රිය වැඩීමෙහි සීමාවක් නොමැති බවත් දක්වන පුවතක් ලෙස ඛුද්දකවත්ථුඛන්ධකයෙහි එන සරපයකු දෂ්ට කරන ලදුව කළුරිය කළ භික්ෂුවගේ පුවත සහ එහිදී සතර සර්ප රාජ කුලයනට මෛත්‍රී කිරීම පිළිබඳ බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද දේශනාව සඳහන් කළ හැකිය.[23] සිව්මහ අහිරාජකුලයන්ට මෙත් වැඩීමේ මෙකී පුවතම ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භය තුළ සම්භාවනාවට සහ ගෞරවයට පාත්‍ර වූ පිරුවානා පොත් වහන්සේ තුළද ඛන්ධ පරිත්ත නමින් අන්තර්ගතය.[24]

මෛත්‍රී කළයුතු සිව් මහ සර්ප කුලයන් ලෙස, විරූපාක්ෂ අහිරාජ කුලය, ඒරාපථ සර්ප කුලය, ඡබ්‍යාපුත්තක සර්පරාජ කුලය සහ කණ්හාගෝතමක සර්ප කුලය දක්වා ඇත.[25] මෙසේ මෛත්‍රිය කළයුතු අයුරුද දක්වන ඛුද්දකවත්ථුඛන්ධකය තවදුරටත් මිනිසාට හානි පැමිණවිය හැකි කුඩා සතුන්ගේ ලැයිස්තුවක්ද දක්වයි.[26] ඒ අතර සර්පයෝය, ගෝනුසුවොය, පත්තෑයෝය, දිවිමකුළුවෝය, සිකනල්ලුය, සහුනෝය, මීයෝය යන මෙකී සතුන්ගේ ශක්තිය සීමාන්තික බවත් ත්‍රිවිධ රත්නයේ ශක්තිය අසීමාන්තික බවත්[27] මෙහි වැඩිදුරටත් දක්වයි. මෙහිදී අපගේ අවධානය යොමුවිය යුත්තේ මෙලෙස මෛත්‍රී කිරීම කෙසේ කායික සෞඛ්‍යයට බලපාන්නේද යන ප්‍රස්තුතය වෙතය. මනස ඍජුවම කායික ක්‍රියාවලියට බලපාන බව නූතන මනෝවිද්‍යාත්මක ගුරුකුලයන්හි පිළිගැනීමයි. මනෝවිශ්ලේෂණවාදීන් මෙකී මතය මූලිකව ගෙන තම ඉගැන්වීම් මෙන්ම න්‍යායන්ද ගොඩනගා තිබෙනු පෙනේ.[28] සියලුම කායික සහ වාචසික ක්‍රියාවනට මූලික වන්නේද මනසම බවත් යහපත් මනසින් කරන කියන දේ හට සැප විපාකත්[29] අයහපත් මනසින් කරන කියන දේ හට අයහපත් විපාකත්[30] හිමිවන බව ධම්මපදයේ යමක වග්ගයේ සඳහන් වීම උක්ත ගුරුකුලයන්හි ඉගැන්වීම් නිවැරදි බව සිහිකරවයි. මානසිකත්වය ඍජුවම කායික සෞඛ්‍යය යහපත්ව පවත්වාගැනීමට බලපාන බව පැහැදිලි අතර නිරතුරුවම මනස සමබරව මෙන්ම ධනාත්මකව යහපත් සිතිවිලි වලින් ගහනව තිබීම එලෙස යහපත් කායික සෞඛ්‍යයකට මග පාදයි. එසේ හෙයින් භික්ෂුවගේ මනස නිරතුරුවම මෛත්‍රී සහගතව තබාගැනීමට මෙකී සිව් සර්ප කුලයන්ට මෛත්‍රී කිරීම පුරුදු පුහුණු කිරීම මගින් හැකියාක් ඇති බව සිතිය හැකිය. එලෙස මෛත්‍රී වැඩීම භික්ෂු දිවියේ කායික සශ්‍යතාව උදෙසාම හේතුවන බව සිතිය හැකිය. තවද මිනිසාට හානි පැමිණවිය හැකි කුඩා සතුන් කිහිපදෙනෙකුගේ නම් වශයෙන්ම දක්වා එකී සතුන් විසින් භික්ෂුවට හානි පැමිණවීම සිදුකළ හැකි බැවින් ආරක්ෂාකාරී විය යුතු බවද වක්‍රාකාරයෙන් මෙන් මතක් කරයි.[31]

තම පුරුෂ නිමිත්ත තමන් විසින්ම ඡේදනය කරගත් භික්ෂුවක් පිළිබඳව ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහි සඳන්වේ.[32] එකී පුවත සැලවීමෙන් පසුව බුදුහු වදාරනුයේ යමෙක් තමන්ගේ අංගජාතය සිඳින්නේ වී නම් ඕ හට තුලැසි ඇවතක් සිදුවන බවයි.[33] මෙකී පුවත ඍජුවම කායික

සෞඛ්‍යය සමග බැඳී කරුණකි. මෙම පුවත අට්ඨකථායෙහි වැඩිදුරටත් විස්තර වේ.[34] තමන්ගේ අංගජාතය සිඳින මහණහුට ථුල්ලච්චය වේ. කන් නාස් ඇඟිලි ආදීහූ අන් යම් කිසිවකින් සිඳින මහණහුට, මිට ආදියෙන් තැළීම් ආදීවූ එබඳු දුකක් හෝ උපදවන මහණහුට දුක්කටය වේ. සර්පයන් හා පනුවන් විසින් කළ දෂ්ට කිරීම් ආදිය ඇති කල්හි හෝ අන් ආබාධයක් හේතුකොට හෝ ලේ මුදා හරින්නහුටද යම් සිරුරු අවයවයක් සිඳින්නහුටද ඇවතක් සිදුනොවේ.[35] මේ අනුව හුදු අංගජාතය පමණක් නොව අනෙකුත් ශාරීරාවයන් සිඳීමටද ඇති අවකාශය වළකයි. නමුදු දිවිරැකීම් වශයෙන් එසේ ශරීරාවයවයන් සිඳීමට විනයෙන් කිසිඳු බාධාවක් නොමැත. මෙහිදී විශේෂයෙන් පෙනෙන කරුණක් නම් මෙකී විනය පැනවීම් හුදු නොපැහැදුනවුන්ගේ පැහැදීම සඳහාම පමණක් නොවන බවත් භික්ෂුවගේ කායික සෞඛ්‍යය පිළිබඳවද සැලකිල්ලට ගනිමින්ද පනවන ලද බවයි.

අනතුරුව හමුවන පාත්‍රා දැරීම පිළිබඳ දේශනාව වනාහි ආහාර ගන්නා බඳුනෙහි ස්වභාවය කෙබඳු විය යුතුදැයි දක්වෙන අතර එකී පාත්‍රයෙ පරිහරණය කිරීමේ ක්‍රමවේදයද බුදුහු වදාරති.[36] විසිතුරු පාමඩුලු දැරීම, දිය සහිත පාත්‍රය දූෂ්‍ය වේ යන්න, පාත්‍ර දුගඳ වීම, පාත්‍ර උෂ්ණයෙහි තැබීම, සුළි හුළඟින් පාත්‍රා බිඳී ගියේද යන්න, පිල් කෙළවර පාත්‍ර තැබීම, පුටු පිල් කෙළවර පාත්‍ර තැබීම, පාත්‍ර සඳහා තණ ඇතිරිය, රෙදි ඇතිරිය, පාත්‍ර මාලකය, පාත්‍ර කණ්ඩෝලිකාව හා පාත්‍ර ථවිකය, අංසබන්ධනය, පාත්‍ර බඳනා හුය යන මෙතෙක් දෑ ද අමතරව දැරිය හැකි පාත්‍ර වර්ගද පඩික්කමද[37] අනුදැන වදාරන බුදුපියාණන් වහන්සේ භික්ෂුවගේ කායික සෞඛ්‍යය පිළිබඳ කෙතරම් සියුම්ව සිතුවේද යන්න පැහැදිලිවෙයි. තවද බුදුපියාණන් වහන්සේ විසින් භික්ෂුවට පෙරහන්කඩයක් අනුදැන වදාරන පුවතක්ද මෙහි හමුවේ. එයිනුදු භාග්‍යවතුන් වහන්සේ අපේක්ෂා කරන ලද්දේ භික්ෂුවට පිරිසිදු ජලය පානය කිරීමේ අවස්ථාව සලසා දීමයි. භික්ෂුව මදුරුවන්ගෙන් ආරක්ෂා වනු පිණිස සවුරු කිළිය බුදුහු අනුදැන වදාරති.[38] මෙම පැනවීම් මගින්ද බුදුපියාණන් වහන්සේ භික්ෂුව කායික වශයෙන් ශක්තිමත් වනු දකිනු කැමැත්තෙන් වූ බවක් දක්නට ලැබේ. සක්මන් මළුවක් ද අනුදැන වදාරණ බුදුහු භික්ෂුවගේ කායික හා මානසික සෞඛ්‍යය පිළිබඳ වඩාත් සැලකිලිමත් වූ අතර එමගින් භික්ෂුවට සමාධියෙන් යුතුව ඇවිදීමේ අවස්ථාව සලයසි.[39] කැසිකිලියක් අනුදැන වැදෑරීමද වැසිකිලි

අනුදූන වැදෑරීමද පිළිබඳවද මෙහිදී බුදුහු සඳහන් කරති.[40] එසේම එකී වැසිකිලි සහ කැසිකිලි පිරිසිදුව පවත්වාගත යුතු ආකාරය පිළිබඳවද විස්තාරිතව විග්‍රහ කරයි. විනය පිටකයෙහි ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහි දහසෙක් වස්තුහු වන බවත් ඒවා ශාසනයාගේ චිරස්ථිතිය පිණිස වන බවත් මෙකී සියලුම පැනවීම් ප්‍රියශීලී පැවිද්දන් හටම පමණක් බවත් එහිම වෙති.[41]

සමාලෝචනය

බුදුපියාණන් වහන්සේ වනාහි ලොව මෙතක් පහළ වූ ශ්‍රේෂ්ඨතම මානව සම්පත යැයි පැවසීම අරුමයක් නොවේ. උන්වහන්සේ කිසිඳු පැනවීමක් හේතු රහිතව සිදුනොකරන ලද බවට සමස්ථ ත්‍රිපිටකයම සාක්ෂ්‍ය දරයි. ඇතැම් පැනවීමක මතුපිටට නොපෙනෙන ගැඹුරු දාර්ශනික පසුබිමක් ඇති බව පෙනී යන්නේ එකී ධර්ම කරුණු විශ්ලේෂණය කිරීමත් සමගය. නූතන විද්‍යාත්මක සොයාගැනීම් හා සැසඳිය හැකි බුද්ධ දේශනාව සැම විටම විද්‍යාවට වඩා පියවරක් ඉදිරියෙන් සිටී. එසේ හෙයින් විද්‍යාක්ෂියට අසුකර ගත නොහැකි සූක්ෂ්ම ගැඹුරු ඉගැන්වීම් සමූහයක එකතුවක් ලෙස ඛුද්දකවත්ථුක්ඛන්ධකයේ එන ඇතැම් ඉගැන්වීම් හඳුනාගත හැකිය. බොහෝ විට විනය පැනවීම්හි විද්‍යාත්මක පසුබිම පිළිබඳව සාකච්ඡාව පසෙක ලා ජන විරෝධය හේතුවෙන් පනවන ලද බව දක්වයි. යහපත් සෞඛ්‍යය දිවියක් ගතකිරීමට අවශ්‍ය කුඩා වූත් එහෙත් ඍජු බලපෑමක් ඇති කරුණු පිළිබඳව තොරතුරු සපයන විශ්වසනීය මූලාශ්‍රයක් ලෙස චුල්ලවග්ගපාළියෙහි එන ඛුද්දකවත්ථුක්ඛන්ධකය සම්භාවනාවට ලක්විය යුතු අතර එකී විනයවාදී භික්ෂූන්ටම මෙම ඉගැන්වීම් සමුදාය පූජාර්හ වේවායි යන උදානයෙන් ඛුද්දකවත්ථුක්ඛන්ධකය අවසන් වේ.

ආන්තික සටහන්

1. තදෙතං සබ්බම්පි බුද්ධවචනං රසවසෙන එකවිධං, ධම්මවිනයවසෙන දුවිධං, පඨමමජ්ඣිමපච්ඡිමවසෙන තිවිධං; තථා පිටකවසෙන, නිකායවසෙන පඤ්චවිධං, අඞ්ගවසෙන නවවිධං, ධම්මක්ඛන්ධවසෙන චතුරාසීතිසහස්සවිධන්ති වෙදිතබ්බං. *සමන්තපාසාදිකානාමවිනයට්ඨකථා*, (1929) (සංස්.) බද්දේගම පියරතන මහා ථේර සහ වැලිවිටියේ සෝරත ථේර, හේවාවිතාරණ මුද්‍රණය. පිටු. 9

2. සුමනපාල ගල්මංගොඩ, *බෞද්ධායුර්වේද මනෝකායික චිකිත්සා ක්‍රමය හැඳින්වීමක්*, (2014), නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය, පිටු. 4

3. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, *පාලි සාහිත්‍යය.* (සිව්වන මුද්‍රණය) (2007), රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ 10, පිටු. 114

4. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ නහායමානා රුක්ඛෙ කායං උග්ඝංසෙන්ති, ඌරුම්පි බාහුම්පි උරම්පි පිට්ඨිම්පි. *ඛුද්දකවත්ථුක්ඛන්ධකය, චුල්ලවග්ගපාළි 2*, (2005) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පිටු. 2

5. මනුස්සා උජ්ඣායන්ති ඛියන්ති විපාචෙන්ති - කථඤ්හි නාම සමණා සක්‍යපුත්තියා නහායමානා රුක්ඛෙ කායං උග්ඝංසෙස්සන්ති, ඌරුම්පි බාහුම්පි උරම්පි පිට්ඨිම්පි, සෙය්‍යථාපි මල්ලමුට්ඨිකා ගාමමොද්දවාති. ඛුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) - එම - පිටු. 2

6. Monks, while a monk is bathing he should not rub his body against a tree. Whoever should (so) rub it, there is an offence of wrong-doing. *The Book of Discipline* (Vinaya-Piṭaka V), (2001), (Translated by) I.B. Horner, Pali Text Society, Oxford, p. 141

7. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛියන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි -සච්චං කිර, භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛූ නහායමානා රුක්ඛෙ කායං උග්ඝංසෙන්ති, ඌරුම්පි බාහුම්පි උරම්පි පිට්ඨිම්පීති? සච්චං භගවාති. විගරහි බුද්ධො භගවා - අනනුච්ඡවිකං, භික්ඛවෙ, තෙසං මොඝපුරිසානං අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථඤ්හි නාම තෙ, භික්ඛවෙ, මොඝපුරිසා නහායමානා රුක්ඛෙ කායං උග්ඝංසෙස්සන්ති, ඌරුම්පි බාහුම්පි උරම්පි පිට්ඨිම්පි? නෙතං, භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදායඣපෙ.ඣ විගරහිත්වාඣපෙ.ඣ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි - න, භික්ඛවෙ, නහායමානෙන භික්ඛුනා රුක්ඛෙ කායො උග්ඝංසෙතබ්බො. යො උග්ඝංසෙය්‍ය, ආපත්ති දුක්කටස්සාති.

8. ඛුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) - එම - පිටු. 2

9. ඛුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) - එම - පිටු. 2-7

10. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ජරාදුබ්බලො නහායමානො න සක්කොති අත්තනො කායං උග්ඝංසෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. අනුජානාමි, භික්ඛවෙ, උක්කාසිකන්ති. තෙන ඛො පන සමයෙන භික්ඛූ පිට්ඨිපරිකම්මං කාතුං කුක්කුච්චායන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අනුජානාමි, භික්ඛවෙ, පුථුපාණිකන්ති.

    බුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) - එම - පිටු. 6

11. රුක්ඛෙ ථම්භෙ ච කුට්ටෙ ච, අට්ටානෙ ගන්ධසුත්තියා;

    විගය්හ මල්ලකො කච්ඡු, ජරා ච පුථුපාණිකා. බුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) - එම - පිටු. 116

12. Against a tree, and against a post, and against a wall,

    on a rubbing-board (using a) gandha (-bba hand instrument), a string,

    having plunged into, a scrubber, scab,

    and age, ordinary mode with the hand.

    The Book of Discipline (Vinaya-Piṭaka V), (2001), (Translated by) I.B. Horner, Pali Text Society, Oxford, p. 198

13. න භික්ඛවෙ, වල්ලිකා ධාරෙතබ්බා න පාමඞ්ගො ධාරෙතබ්බො න කණ්ඨසුත්තකං ධාරෙතබ්බං න කටිසුත්තකං ධාරෙතබ්බං න ඔවට්ටිකං ධාරෙතබ්බං න කායුරං ධාරෙතබ්බං න හත්ථාභරණං ධාරෙතබ්බං න අඞ්ගුලිමුද්දිකා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සාති. බුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2,* (2005) - එම - පිටු. 8

14. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ දීඝෙ කෙසෙ ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛිය්‍යන්ති විපාචෙන්ති - සෙය්‍යථාපි ගිහී කාමභොගිනොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. න, භික්ඛවෙ, දීඝා කෙසා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. බුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2,* (2005) - එම - පිටු. 8

15. Monks, long hair should not be worn. Whoever should wear it (long), there is an offence of wrong-doing. I allow it to be of a two months' growth or two finger-breadths (in length) *The Book of Discipline* (Vinaya-Piṭaka V), (2001), (Translated by) I.B. Horner, Pali Text Society, Oxford, p. 144

16. අනුජානාමි භික්ඛවෙ දුමාසිකං වා දුවඞ්ගුලං වාති. ඛුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) - එම - පිටු. 8

17. දුමාසිකං වා දුවඞ්ගුලං වාති එත්ථ සචෙ කෙසා අන්තොද්වෙමාසෙ ද්වඞ්ගුලං පාපුණන්ති, අන්තොද්වෙමාසෙව ඡින්දිතබ්බා. ද්වඞ්ගුලෙහි අතික්කාමෙතුං න වට්ටති. සචෙපි න දීඝා, ද්වෙමාසතො එකදිවසම්පි අතික්කාමෙතුං න වට්ටතියෙව; එවමයං උභයෙනපි උක්කට්ඨපරිච්ඡෙදොව වුත්තො, තතො ඔරං පන නවට්ටනභාවො නාම නත්ථි. *සමන්තපාසාදිකානාමවිනයට්ඨකථා*, (1929) (සංස්.) බද්දේගම පියරතන මහා ථේර සහ වැලිවිටියේ සෝරත ථේර, හේවාවිතාරණ මුද්‍රණය. පිටු. 888

18. *සමන්තපාසාදිකාවිනයට්ඨකථා 3*, (සිංහල පරිවර්තනය) (2009) (පරි) අම්බලන්ගොඩ ධම්මකුසල මහානායක ස්ථවිර, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පිටු. 212

19. https://www.quora.com/What-are-the-hair-health-Benefits-of-shaving-the-head (accessed on 13th June, 2019)

20. http://baldhandsomeman.com/index.php/2018/05/13/benefits-and-advantages-of-shaving-your-head/ (accessed on 13th June, 2019)

21. https://www.rd.com/health/conditions/benefits-of-being-bald/ (accessed on 13th June, 2019)

22. Monks, ear ornaments should not be worn, chains … ornamental strings of beads for the throat … ornaments at the waist … bangles … armlets … bracelets … finger rings should not be worn. Whoever should wear (any of these things), there is an offence of wrong-doing.

    The Book of Discipline (Vinaya-Piṭaka V), (2001), (Translated by) I.B. Horner, Pali Text Society, Oxford, p. 144

23. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො චක්ඛුරොගාබාධො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අනුජානාමි, භික්ඛවෙ, ආබාධප්පච්චයා මුඛං ආලිම්පිතුන්ති.ඛුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පිටු. 10

24. ඛුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) - එම - පිටු. 10

25. ඛන්ධ පරිත්ත, *මහා පිරුවානා පොත් වහන්සේ*, (2013), සූසර ප්‍රකාශකයෝ, කොළඹ 11, පිටු. 23-24

26. The royal snake family of Virūpakkha, the royal snake family of Erāpatha, the royal snake family of Chabyāputta, the royal snake family of Kaṇhāgotamaka. *The Book of Discipline* (Vinaya-Piṭaka V), (2001), (Translated by) I.B. Horner, Pali Text Society, Oxford, p. 148

27. අහි විච්ඡිකා සතපදී, උණ්ණනාභි සරබූ මූසිකා;

    කතා මෙ රක්ඛා කතං මෙ පරිත්තං, පටික්කමන්තු භූතානි.

    බුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පිටු. 16

28. Immeasurable is the Awakened One,

    immeasurable dhamma,

    immeasurable the Order.

    Limited are creeping things: snakes, scorpions,

    centipedes, spinning spiders, lizards, mice.

    The Book of Discipline (Vinaya-Piṭaka V), (2001), (Translated by) I.B. Horner, Pali Text Society, Oxford, p. 149

29. ගාමිණී හපුආරච්චි, *මූලික මනෝවිද්‍යා ප්‍රවේශය*, (2011), සුසිත ප්‍රකාශන, රාජගිරිය, පිටු. 37-51

30. Manopubbaṅgamā dhammā

    manoseṭṭhā manomayā

    Manasā ce paduṭṭhena

    bhāsati vā karoti vā

    Tato naṃ dukkhamanveti

    cakkaṃva vahato padaṃ (1st verse of yamaka vagga)

    The Dhammapada. ed. Sri Dhammananda, K. (1988), Sasana abhiwurdhi waradana society, Kuala Lumpur, p.42

31. Manopubbaṅgamā dhammā

    manoseṭṭhā manomayā

manasā ce pasannena

bhāsati vā karoti vā

tato naṃ sukhamanveti

chāyāva anapāyinī (2nd verse of yamaka vagga)

The Dhammapada. ed. Sri Dhammananda, K. - Ibid. - p.41

32. අහි විච්ඡිකා සතපදී, උණ්ණනාභි සරබූ මූසිකා; කතා මෙ රක්ඛා කතං මෙ පරිත්තං, පටික්කමන්තු භූතානි. ඛුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පිටු. 16

33. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අනභිරතියා පීළිතො අත්තනො අඞ්ගජාතං ඡින්දි. ඛුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) - එම - පිටු. 16

34. Monks, one should not cut off one's own male organ. Whoever should cut it off, there is a grave offence. *The Book of Discipline* (Vinaya-Piṭaka V), (2001), (Translated by) I.B. Horner, Pali Text Society, Oxford, p. 149

35. න භික්ඛවෙ අත්තනො අඞ්ගජාතන්ති අඞ්ගජාතං ඡින්දන්තස්සෙව ථුල්ලච්චයං. අඤ්ඤං පන කණ්ණනාසා අඞ්ගුලිආදිං යංකිඤ්චි ඡින්දන්තස්ස තාදිසං වා දුක්ඛං උප්පාදෙන්තස්ස දුක්කටං. අහිකීටදට්ඨාදීසු පන අඤ්ඤ ආබාධපච්චයා වා ලොහිතං වා මොචෙන්තස්ස ඡින්දන්තස්ස වා අනාපත්ති. *සමන්තපාසාදිකානාමවිනයට්ඨකථා,* (1929) (සංස්.) බද්දේගම පියරතන මහා ථේර සහ වැලිවිටියේ සෝරත ථේර, හේවාවිතාරණ මුද්‍රණය. පිටු. 890

36. *සමන්තපාසාදිකාවිනයට්ඨකථා 3*, (සිංහල පරිවර්තනය) (2009) (පරි) අම්බලන්ගොඩ ධම්මකුසල මහානායක ස්ථවිර, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පිටු. 214

37. various kinds, bases of bowls, gold, thick, jags, Carved, was spoiled, nasty smelling, in the heat, were broken, by a solid bench, plaster flooring, grass (mat), piece of cloth, a stand, and on a wicker stand. *The Book of Discipline* (Vinaya-Piṭaka V), (2001), (Translated by) I.B. Horner, Pali Text Society, Oxford, p. 199

38. චිත්‍රා දුස්සති දුග්ගන්ධො, උණ්හෙ හිජ්ජිංසු මිඩ්ඪියා;

පරිභණ්ඩං තිණං චොළං, මාලං කුණ්ඩොලිකාය ච.

ථවිකා අංසබද්ධඤ්ච, තථා බන්ධනසුත්තකා;

බිලෙ මඤ්චෙ ච පීඨෙ ච, අඩ්කෙ ඡත්තෙ පණාමනා.

තුම්බසට්ඨවසීසං, චලකානි පටිග්ගහො ඛුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පිටු. 116

39 ඛුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) - එම - පිටු. 118- 119

40. ඛුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) - එම - පිටු. 118 - 119

41. ඛුද්දකවත්ථුක්ඛන්ධකය, චුල්ලවග්ගපාළි 2, (2005) - එම - පිටු. 124 - 125

42. එවං දසසතා වත්ථූ, විනයෙ ඛුද්දකවත්ථුකෙ; සද්ධම්මට්ඨිතිකො චෙව, පෙසලානඤ්චනුග්ගහො ඛුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) - එම - පිටු. 127

43. සුසික්ඛිතො විනයධරො, හිතචිත්තො සුපෙසලො; පදීපකරණො ධීරො, පූජාරහො බහුස්සුතොති. ඛුද්දකවත්ථුක්ඛන්ධකය, *චුල්ලවග්ගපාළි 2*, (2005) - එම - පිටු. 127